පොලිස් කෲරත්වය ප්‍රවර්ධනය කිරීම යහපත් මාධ්‍යකරණයක් ද?

"බෙලිඅත්තේ සංහාරය (අපට කීමට ඇති කතාව)" යන සිරස්තලයෙන් යුතුව දිවයින පුවත්පතේ (ජනවාරි 24, 2024) කතුවැකියක් පළ වී තිබිණි.

එම කතුවැකිය තුළ පහත ආකාරයේ අදහස් ද ඇතුළත් වී තිබිණි.

* "පොලිසිය දෙක දෙන විට තමන් එවන ලද්දේ කවර ෆිනෑන්ස් කොම්පැනියක් විසින්දැයි ඔවුන් කියනවා ඇත."

* "මිනී මැරුම යනු ඉතාම නරක අවියකි. එහෙත් පාතාල මර්දනයේදී එම ආයුධය යොදාගත්තාට කමක් නැති බව අපට සිතේ."

ඔබ සිතන ලෙසට,

1) මෙය පොලිස් කෲරත්වය සාධාරණීකරණය කිරීමක් නොවේ ද?

2) වගකීමක් සහිත පුවත්පතක කතුවැකියක් එවැනි අදහස් සමාජගත කිරීම කෙතරම් මාධ්‍ය ආචාර ධර්මයන්ට අනුකූල ද?

පොලිස් කෲරත්වය සාධාරණීකරණය නොකරමු!




බෙලිඅත්තේ සංහාරය
(අපට කීමට ඇති කතාව)

පසුගිය දවසක සීසර්ලා පිරිසක් විසින් ෆිනෑන්ස් කළ වාහනයක් පැහැරගෙන යන හැටි අපි සමාජ මාධ්‍ය ඔස්සේ දුටුවෙමු. මෙවැනි අවස්ථාවලදී ජනතාව සංවිධානය වී එම සීසර්ලාට පහරදී ඔවුන් කුදලා පොලිසියට භාරදිය යුතුය. පොලිසිය දෙක දෙන විට තමන් එවන ලද්දේ කවර ෆිනෑන්ස් කොම්පැනියක් විසින්දැයි ඔවුන් කියනවා ඇත. හැබැයි පාතාලකාරයන්ගෙන් නම් ඇත්ත දැනගැනීමට කොච්චර ගැහුවත් දුෂ්කර ය. මිනී මැරුම යනු ඉතාම නරක අවියකි. එහෙත් පාතාල මර්දනයේදී එම ආයුධය යොදාගත්තාට කමක් නැති බව අපට සිතේ.